

# ආදරයෙනම්

ශෂී සමරවීර

"අනේ... හරි අමාරුයි මයේ මැණිකේ... ඔය මදෑ...කොච්චර අතගෑවත් ඔච්චර තමා..." සේතුපාල ඇඳේ දිගෑදිලා ඉඳිද්දි සේතුපාලගේ බිරිඳ වෙච්ච බිසෝ මැණිකා හිටියේ සේතුපාලගේ කොන්දට තෙල් සාත්තුවක් කරන ගමන්...

"දඟලන්නෙපා අපේ මහත්තයා... තව ඩිංගිත්තක් ඕම ඉන්න."

"හ්ම්ම්ම්.."

"ඕං රණතුංග මුදලාලි අදත් නොක්කාඩු කිව්වා.. ණයටික දෙන්නෑ කියලා.. මං නොවඳිනා වැඳුම් වැඳලා හාල් පරිප්පු ඩිංගිත්තක් අරන් ආවා."

බිසෝ මැණිකා වෙච්ච දේ හැංගුවේ වෙච්ච දේ කිව්වනං සේතුපාලගේ අතින් මිනී මැරුමක් වෙන්න උනත් ඉඩ තියන නිසා. "බිසෝ.. උඹ ඔය දරුවොයි අරෑවයි අතෑරලා මං ලඟට වරෙන්... මං උඹට ඕන තරං සැප සම්පත් දීලා බලාගන්නං.උඹ දන්නවනේ ඉතිං මගේ හැටි." ගමටම තිබ්බ එකම කඩේ මුදලාලි වෙච්ච රණතුංග බිසෝ දිහා කෑදර බැල්මක් දාන ගමන් එහෙම කිව්වේ බිසෝ පොඩි එවුන්ට කන්න දෙයක් ඉල්ලන්න ගිය වෙලාවේ.

"මුදලාලි මං අම්මා කෙනෙක්...පව් කතා කියන්නෙපා.අපිට කන්න බොන්න අඩුපාඩු උනාට අපි හොඳින් ඉන්නවා. මුදලාලිගේ හොරගෑනි වෙනවට වඩා හොඳයි මම නියගලා අලයක් කාලා මැරිලා යනවා." මේම කියපු බිසෝ ගස්සගෙන යන්න ගියා. "කන්න බොන්න නැති උනාට මොකද මේකිගේ වලව් ආඩම්බරකමනං. උඹව දවසකට හරි මගේ ගෑනි කරනොගත්තොත් මම රණතුංග නෙවේ. හොඳයි බලමුකෝ කුමාරිහාමි උඹ තව කොච්චරකල් නටයිද කියලා. 'බන්ඩෝ මෙහේ වරෙන්... මෙන්න මේ බඩු ටික අර සේතුවගේ ගෙදරට ගිහින් දීපන්.. ඒකි බඩු ගන්න ආවට දාලා ගිහින්" "කොහේද මැණිකේ ගිහින් හිටියේ. මං කතා කරනවා අහුන්නැද්ද..."

බිසෝ ගැස්සිලා අහැරුනේ ඒ කටහඬට. "ආහ් නෑ අපේ මහත්තයා... මං මේ... නිකමට වගේ..."

"පොඩි එවුන් නිදිද බිසෝ."

සේතුපාල මේ විදියට කතා කරනවට බිසෝ හරි කැමතියි.

"ම්... ඔව්.. අද බඩ පිරිලනේ.. වේලාසන නිදි... උන්ට කොස් ගිලලම ඇති වෙලානේ තිබුනේ මහත්තයා."

"මෙහාට වරෙන්කෝ ඒනං. "

"ඔය. නාකි උනාට මොකද විසේනං ගිහින් නෑ තාම."

බිසෝ හිනාවීගෙනම සේතුපාලගේ පපුව උඩින් දිගෑදුනා. සේතුපාලගේ දික් ඇඟිලි බිසෝගේ කෙස් අතර අතරමං උනා. "මං එක්ක ඇවිත් උඹ දුක් විඳිනවා නේද කුමාරිහාමි."

"කට කට... මං කිව්වා ඔයැයිට ඔය කතාව ආය කියන්නෙපා කියලා... මොකෝ මං බබෙක්යැ. මං අපේ මහත්තයා එක්ක ආවේ ඕන දුකක් කරදරයක් විඳින්න බලාගෙන... අනික මොකෝ මං දුකින්ද. මේ ඉන්නේ යස අපූරුවට."

බිසෝ මේම කිව්වත් බිසෝට මතක් උනේ කාලෙකට කලින් ඇය වලව්වක අතට පයට වැඩකාරයෝ තියාගෙන රැජිණක් වගේ ඉඳපු හැටි.වලව්වේ වත්තේ වැඩට හිටපු වයසක මනුස්සයා අත්උදව්වට එක්ක ආව සේතුපාල එක්ක හාද වෙලා හඳපානේ පැනලා ආව හැටි.සේතුපාල ඒ කාලේ යස ඉලන්ධාරියා.

"උඹලට කවදාවත් හොඳින් ඉන්න ලැබෙන්නෑ."

බිසෝගේ බඩට පලවෙනි දරුවා ආව දවස්වල බිසෝට තමන්ගේ අම්මව දකින්න ඕන උනත් සේතුපාල ඒ වැඩේට කැමති උනේම නෑ. ඒත් බිසෝගේ පෙරැත්ත කිරීමත් එක්ක සේතුපාල බිසෝව ආයෙත් වලව්වට එක්කන් ගියේ අකමැත්තෙන්. එදා තමන්ගේ අම්මා ඒ කිව්ව කතාව බිසෝට අදටත් ගලේ කෙටූ අකුරක් වගේ මතක තිබ්බා.

"ඔය හිඟන්නව අතෑරලා වරෙන් ආය. බඩේ ඉන්න හිඟන පැටියත් හම්බුනාම කාටහරි දීලා දාමු. අර ඉද්දමල්ගොඩ වලව්වෙන් ගිය සතියෙත් උඹ ගැන ඇහැව්වා.උන්දැලැ තාම මනාපයි බං."

බිසොගේ ඇස් වලට වක්කඩ කැඩුවා වාගේ කඳුළු ආවේ තමන්ගෙම අම්මා දරුවව පිටඋන්ට දෙන්න කියපු එකට. අම්මට හොඳටම දොස් කියලා එදා ගෙදරින් දොට්ට බැහැපු බිසෝ හිතුවේ තමන් මැරෙනකං ආය වලව්ව පැත්තවත් බලන්නෑ කියලා හිතාගෙන.

"තොපිට හරියන්නෑ බොල...කවදාවත් හොඳින් ඉන්න ලැබෙන්නෑ.. ඕන්න බලාපංකෝ..මේ ඩිංගිරි මැණිකගේ වචන කවදාවත් වරදින්නෑ."

බිසෝගේ අම්මගේ සද්දේ පාරට යනකංම ඇහුනා...

"බිසෝ."

"ම්ම්ම්ම්."

"නිදිද."

"නෑ අපේ මහත්තයා..ඒක නෙවේ ලොකු එකා ඉස්කෝලේ යන්න බැහැයි කියනවා ඔන්න..."

"ඒ මොකද බිසෝ."

" උඟට විහිළු කරනවා කියන්නේ."

"කව්ද?"

"ඉස්කෝලේ එවුන්.උගේ ඇඳුම් සපත්තු සේරම ඉරිලා ගිහිල්ලා මහත්තයා.අනික් එව්වෝ විහිළු කරනවලු."

"හ්ම්ම්.... මං හෙට දිහාට ඇවිදලා බලන්නං බිසෝ වැඩක් හොයාගන්න. දැං මට සනීපයි නොවැ."

"කොහේ සනීපද මහත්තයා. පිස්සු නැතුව තව ටික දවසක් ගෙදරට වෙලා ඉන්ට... මං බැලුවේ හෙට ඉඳන් කොහු මෝලට යන්න කියලා. "

"අනේ මැණිකේ උඹ කොහොමද ඔව්වා කරන්නේ.මාව ගහෙන් වැටුනේ නැත්තං උඹලව ඔහොම හාමත් කරන්නෑ බං මම.මගේම කරුමෙට එදා මට ගහ අතෑරුනේ. "

"ඒම කියන්නෙපා මහත්තයා. පෙර පිනකට තමා ලොකු අමාරුවක් නොවුනේ." "නිදාගනින් මැණිකේ...රෑ බෝ වෙලා." කොච්චර රෑ බෝ උනත් සේතුපාලටවත් බිසෝටවත් නිදාගන්න පුළුවංකමක් තිබ්බේ නෑ."

"අනේ කතා කරපං මයේ අම්මා. අනේ මහත්තයා.. මේකා කතා කරන්නෑ..." බිසෝ පිස්සියක් වගේ අවුරුදු 3ක් වෙච්ච තමන්ගේ බාල පුතාගේ හිස තුරුල් කරගෙන කෑ ගැහුවා.

"අනේ මහත්තයා. මයේ කොල්ලා. නැගිටපන් රත්තරනේ. මේ අම්මා අම්මා... අනේ නැගිටපංකෝ..."

"සමාවෙන්න.. දරුවව ඇයි ඉස්පිරිතාලේ එක්ක නොආවේ මෙච්චරකල්... පුතාට හරියට බෙහෙත් ටික වැටුනනං අද මෙහෙම දෙයක් වෙන්නෑනේ.. දැං කල් ගියා වැඩියි තාත්තා.. අපිට කරන්න දෙයක් නැහැ.. තමුන්ලගේ වරද.. "

"දොස්තර දන්නෑනේ අපේ වගක්... කොල්ලට බඩේ ගායයි වමනෙයි හැදිලා සති දෙකකට වැඩියි... ටවුමේ ඩිස්පෙන්සරියෙන් බෙහෙත් ගන්න තරං සල්ලි කොයින්ද අපිට.. ඒකයි ගොඩ වෙදකං කර කර උන්නේ. බැරි බැරි ගාතේ ගහකට දෙකකට බඩ ගාලයි මේ ටවුමට එක්කන් ආවෙත්.. නැත්තං මං මයේ කොල්ලව විහින් නැති කරගන්නවද බුදු මහත්තයෝ." සේතුපාල ඔළුවේ අත ගහන් කියවන්න ගත්තා. තමන්ගේ දරුවා ඇඳක් උඩ කිසිම හැල හොල්මනක් නැතුව ඉන්නවා දකින සේතුපාලට වාවන්නැතුව ගියා.

මිනිය ගමට ගෙනියන්නවත් පෙට්ටියක් ගන්නවත් සල්ලි නොතිබුන නිසා ටවුමෙම තිබ්බ සොහොනට ගෙනිච්ච පුංචි එකාගේ මිනිය රෙදි කෑල්ලක ඔතලා වළදැම්මා. බිසෝ කීප සැරයක්ම කලන්තේ දාගන බිම ඇද වැටුනේ දරු දුක උහුලගන්න බැරුව. ආපහු ගමට එන ගමනෙදිවත් දෙන්නගේ කතාවක් තිබුනේ නෑ.

"කෝ අම්මා මල්ලි."

ගෙදර ගිය ගමන් බිසෝගේ ලොකු කොල්ලා බිසෝ අතේ එල්ලුනා.

"මල්ලි ආය එන්නෑ මයේ පුතේ.."

44 වන පිටට

